**14-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඒකායන පියා අංක එකේ නළුවා වන අතර ඔහුගේ රංගනය වන්නේ අපවිත්‍ර අයව පිවිතුරු කිරීමයි. වෙනත් කිසිවෙකුට පරම පියා මෙන් රඟපෑ නොහැක.

**ප්‍රශ්නය:** සන්‍යාසීන්ගේ යෝගාව භෞතිකයි. පරම පියා ඔබට ආධ්‍යාත්මික යෝගාව උගන්වන්නේ කෙසේද?

**පිළිතුර:** සන්‍යාසීන් ඔබට උගන්වන්නේ බ්‍රහ්ම තත්ත්වය සමග යෝගාවේ සිටීමටයි. කෙසේවෙතත්, එය වාසස්ථානයක් වන අතර එය භෞතික යෝගාවයි. පදාර්ථ උත්තරීතර බව නොකියයි. ඔය දරුවන් යෝගාවේ සිටින්නේ උත්තරීතර ජීවය සමගයි, ඔබගේ යෝගාව ආධ්‍යාත්මික වන්නේ මේ නිසයි. මෙම යෝගාව ඉගැන්විය හැක්කේ පරම පියාට පමණයි. ඔබගේ ආධ්‍යාත්මික පියා වන්නේ ඔහු පමණයි, එමනිසා, වෙනත් කිසිවෙකුට එය ඉගැන්විය නොහැක.

**ගීතය:** සෙනෙහස් සාගරය ඔබයි. අප ඉන් බිඳකට පිපාසාවෙන් සිටිමු.

ඕම් ශාන්ති. දරුවනේ, බොහෝ මිනිසුන් 'ඕම් ශාන්ති' කියයි, එනම්, ඔවුන් ජීවාත්ම වන තමාගේ හැඳින්වීම ලබා දෙයි, නමුත් ඔවුන්ටම එය වටහාගත නොහැක. 'ඕම් ශාන්ති' යන ව්‍යවහාරයට ඔවුන් බොහෝ විවිධ අරුත් සාදා තිබේ. සමහරු පවසන්නේ ඕම් යනු දෙවියන් බවයි. නමුත් නැහැ! 'ඕම් ශාන්ති' කියා පවසන්නේ ජීවාත්මයයි. තමා වන ජීවාත්මයේ ආදිතම ධර්මය, ශාන්තියයි. ඒ නිසයි, 'මා වන ජීවාත්මය ශාන්තියේ ප්‍රතිමූර්තියක්මි' කියා පවසන්නේ. මේ මා ක්‍රියා සිදුකරන සිරුරයි. එය බොහෝ පහසුයි! ඇත්ත වශයෙන්ම පරම පියාද 'ඕම් ශාන්ති' කියයි. කෙසේවෙතත්, මා සියලු දෙනාගේ පියා නිසා, මා බීජය නිසා, මා කල්ප වෘක්ෂයේ, නිර්මාණ වෘක්ෂයේ මුල, මැද සහ අවසානය ගැන දන්නවා. ඔබ ගසක් දකින විට ඔබට එහි මුල, මැද සහ අවසානය වටහාගත හැක. එම බීජය අජීවිය. පියා විස්තර කරන්නේ මෙය කල්ප වෘක්ෂය වන අතර ඔබට එහි මුල, මැද සහ අවසානය දැන ගත නොහැක. මා එය දන්නවා. මා ඥාන සාගරය ලෙස හැඳින්වෙනවා. මා මෙහි අසුන්ගෙන ඔය දරුවන්ට මුල, මැද සහ අවසානයේ රහස් පහදා දෙනවා. මෙය නාට්‍යයකි, එය නාටකයක් ලෙස හැඳින්වෙන අතර ඔබ එහි නළුවන්ය. පරමාත්ම පියා පවසන්නේ මමත් නළුවෙකි. දරුවන් පවසන්නේ අහෝ බාබා, පාරිශුද්ධකරුවාණෙනි, නළුවෙක් වී මෙහි එන්න! පැමිණ අපවිත්‍ර අයව පිවිතුරු කරන්න! පියා පවසන්නේ මා දැන් රඟපානවා. මගේ චරිත කොටස තිබෙන්නේ මෙම සංගම යුගයෙදි පමණයි. මට මගේම කියා සිරුරක් නැත. මා මේ සිරුර තුළින් රඟපානවා. මගේ නම ශිවාය. ඔහු පහදා දෙන්නේ ඔහු ගේ දරුවන්ට පමණයි. වඳුරන් හෝ සතුන්ගේ පාසැලක් තිබිය නොහැක. කෙසේවෙතත්, පියා පවසන්නේ මනුෂ්‍යයන් තුළ පාපයන් පහ තිබෙන නිසා, ඔවුන්ගේ මුහුණු මනුෂ්‍යයන්ගේ මෙන් වුවද, ඔවුන්ගේ ක්‍රියාකාරකම් වඳුරන්ගේ මෙනි. පරම පියා විස්තර කරන්නේ දරුවන්ටයි. සියලු දෙනාම තමන් අපවිත්‍ර බව කියන නමුත් ඔවුන්ව අපවිත්‍ර කරවන්නේ කවුරුන්ද හෝ ඉන්පසුව පැමිණ ඔවුන්ව පිවිතුරු කරන්නේ කවුරුන්ද කියා ඔවුන් නොදනී. ඔවුන් අඬගසන පාරිශුද්ධකරු කවුද? ඔවුන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත! ඔවුන් සියලු දෙනාම නළුවන් බව ඔවුන්ට වැටහෙන්නේ නැත. ජීවාත්මයක් වන මා, මෙම ඇඳුම ඇඳ චරිත කොටසක් රඟපානවා. ජීවාත්ම පරම දනව්වේ සිට පැමිණ ඔවුන්ගේ චරිත කොටස් රඟපායි. මුළු නාටකයම පදනම් වී ඇත්තේ භාරතය මතය. භාරතය පිවිතුරුව තිබුණි. භාරතය අපවිත්‍ර කළේ කවුද? රාවණ. ලංකාවේ රාවණ රාජ්‍යය තිබුණු බව ඔවුන් ගායනා කරයි. පරම පියා ඔබව අසීමිතභාවයට ගෙන යයි. අහෝ දරුවනි, මේ මුළු ලෝකයම අසීමිත ලංකාවක් (දූපතක්). ඒ ලංකාව සීමිත ලංකාවක්. මේ අසීමිත දූපත මත රාවණගේ රාජධානිය තිබේ. පළමුව එය රාමාගේ රාජධානියව තිබූ අතර දැන් එය රාවණගේ රාජධානියයි. දරුවන් විමසන්නේ බාබා, පරමාත්ම දෙවියන් (රාමා) ගේ රාජධානිය තිබෙන්නේ කොහේද? පියා පිළිතුරු දෙන්නේ දරුවනේ, එය මෙහි පැවතුණු අතර සියලු දෙනාටම එය නැවතත් අවශ්‍යයි. ඔය භාරත ජනතාව, හින්දු ආගමට නොව, ආදි සනාතන දෙව් දේවතා ධර්මයට අයත් විය. සුමිහිරි ආදරණීය බොහෝ කලක් නැතිව සිට දැන් හමු වූ දරුවනේ, ප්‍රථමයෙන් භාරතයේ සිටියේ ඔබ පමණයි. ඔබට එම ස්වර්ණමය යුගී රාජධානිය ලබා දුන්නේ කවුද? ඔබට ඔබගේ උරුමය ලබා දුන්නේ, අනිවාර්යෙන් දිව්‍යමය දෙව් පියාණන්ය. බොහෝ දෙනෙක් වෙනත් ආගම් වලට හැරී ඇති බව පියා විස්තර කරදෙයි. මෙහි මුස්ලිම්වරුන්ගේ

රාජධානිය තිබුණු විට, ඔවුන් බොහෝ දෙනෙක්ව මුස්ලිම් බවට හැරවූහ. මෙහි ක්‍රිස්තියානුවන්ගේ රාජධානිය තිබුණු විට, බොහෝ දෙනෙක් ක්‍රිස්තියානුවන් විය. බෞද්ධයින්ට මෙහි රාජධානියක් නොතිබුණු නමුත් බොහෝ දෙනෙක් බෞද්ධයින් විය ඔවුන් එම ආගමට හැරුණා. එය නැවත වරක් ස්ථාපිත කළ හැකි වන්නේ ආදි සනාතන දෙවි දේවතා ධර්මය අතුරුදහන් වූ පසුවයි. පරම පියා ඔය භාරත ජනතාවට පවසන්නේ මිහිරිතම දරුවනේ, ඔබ සියලු දෙනාම අයත් වුණේ ආදි සනාතන දෙවි දේවතා ධර්මයටයි. ඔබ උපත් 84ක් ගත්තා. ඔබ බ්‍රහ්මීණ්, දේවතා සහ ක්ෂත්‍රීය වංශ තුළට ගියා. ඔබ දැන් දේවතා වංශයට යාම සඳහා බ්‍රහ්මීණ් වංශයට පැමිණ ඇත. ඔවුන් ගායනා කරන්නේ දේවතාවන් වීමට යන බ්‍රහ්මණයන්ට නමස්කාර වේවා. ඔවුන් ප්‍රථමයෙන් බ්‍රහ්මණයන්ගේ නම සඳහන් කරයි. භාරය, දෙව්ලොව බවට පත් කළේ බ්‍රහ්මණයන්ය. මෙය භාරතයේ පෞරාණික යෝගාවයි. පෙර පැවති රාජයෝගාව ගැන ගීතාවේ සඳහන් කර ඇත. ගීතාවේ යෝගාව ඉගැන්වූයේ කවුද? භාරතයේ ජනතාවට එය අමතක වී ඇත. ඔහු ඔය දරුවන්ට යෝගාව ඉගැන් වූ බව පරම පියා පහදා දෙයි. මෙය ආධ්‍යාත්මික යෝගාවයි. අනෙක් සියලුම යෝගාවන් භෞතිකයි. සන්‍යාසීන් භෞතික යෝගාව හෝ බ්‍රහ්ම තත්ත්වය සමග යෝගාව පවත්වන ආකාරය උගන්වයි. එය වැරදියි. බ්‍රහ්ම් තත්ත්වය, වාසස්ථානයකි. එය උත්තරීතර ජීවය නොවෙයි. ඔවුන්ට පියාව අමතක වී තිබේ. ඔබටද ඔහුව අමතක විය ඔබට ඔබගේම ආගම අමතක විය. මෙයත් නාටකයේ නියමිත වී තිබේ. විදේශයන්හි යෝගාව තිබුණේ නැත. හත යෝගාව සහ රාජ යෝගාව පවතින්නේ මෙහිය. හුදකලා මාවතේ සන්‍යාසීන්ට ඔබට රාජයෝගාව ඉගැන්විය නොහැක. එය ඉගැන්විය හැක්කේ එය දන්නා අයට පමණයි. සන්‍යාසීන් තම රාජධානි පවා අත්හරියි. ගෝපිචන්ද රජුගේ නිදසුන තිබේ ඔහු තම රාජධානිය අතහැර වනයට ගියා. ඔහු ගැන කතාවක් තිබේ. සන්‍යාසීන් ඔබට රාජධානියක් අත්හැරීමට සලස්වයි, එබැවින් ඔවුන් රාජයෝගාව උගන්වන්නේ කෙසේද? වර්තමානයේ මුළු ගසම සම්පූර්ණ දිරාපත් තත්ත්වයකට පත් වී තිබේ එය දැන් වැටෙන්නට ආසන්නයි. ගසක් සම්පූර්ණ දිරාපත් තත්ත්වයට පත් වූ විට, අවසානයේ එයට වැටෙන්නට සලස්වයි. ඒ ආකාරයෙන්ම, මේ මනුෂ්‍ය වෘක්ෂයද තමෝප්‍රධාන්‍ය එහි කිසිම ශක්තියක් ඉතිරි වී නැහැ. එය අනිවාර්යෙන් විනාශ වෙයි. එය සිදුවන්නට පෙර ආදි සනාතන දෙවි දේවතා ධර්මය මෙහි ස්ථාපනය කළ යුතුයි. ස්වර්ණමය යුගයේ කිසිවෙක් පහත් තත්ත්වයක නැත. මිනිසුන් විදෙස් ගත වී යෝගාව උගන්වන නමුත් එය හත යෝගාවයි එහි කිසිම දැනුමක් නැත. බොහෝ විවිධ හත යෝගා වර්ග තිබේ. මෙය රාජ යෝගාවයි. එය ආධ්‍යාත්මික යෝගාව ලෙස හැඳින්වෙයි. ඉතිරි සියල්ලම භෞතික යෝගාවන්ය. මනුෂ්‍යයන් එම යෝගාව, මනුෂ්‍යයන්ට උගන්වයි. පරම පියා ඔය දරුවන්ට විස්තර කරන්නේ මා ඔබට මෙම රාජයෝගාව උගන්වන්නේ එක් වරක් පමණයි. වෙනත් කිසිම කෙනෙක්ට එය කිසිදා ඉගැන්විය නොහැක. ආධ්‍යාත්මික පියා, ඔය ආධ්‍යාත්මික දරුවන්ට උගන්වයි නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න එවිට ඔබගේ පාපයන් මැකී යයි. හත යෝගීන්ට කිසිදා මෙය කිව නොහැක. පරමාත්ම පියා විස්තර කරන්නේ ජීවාත්මයන්ටයි. මෙය අළුත් දෙයක්. පරම පියා ඔබව දැන් ජීව අවධානයට පත් කරවනවා. පරම පියාට සිරුරක් නැත. ඔහු මේ කෙනාගේ සිරුර තුළට ඇතුළු වී ඔහුගේ නම වෙනස් කරයි, මන්ද, ඔහු ජීවමානව මියැදී ඇති නිසා. ගෘහවාසීන්, සන්‍යාසීන් වන විට ඔවුන් ජීවමානව මැයැදෙයි. ඔවුන් ගෘහ ආශ්‍රමය අතහැර හුදකලා මාවතට පිවිසෙයි. ඔබ ජීවමානව මියැදෙන විට, ඔබගේ නමද වෙනස් වෙයි. ආරම්භයේ සියලු දෙනාටම නම් දෙන ලදි. ඇතැමුන් මෙම දැනුමට සවන් දී, විශ්මයට පත් වී, වෙන අයටද එය පහදා දී, ඉන්පසුව හැර දමා පිටව ගියා. නම් දීම නතර විය. මේ නිසයි පියා පවසන්නේ මා ඔවුන්ට නම් දී ඉන්පසුව ඔවුන් පැන යන්නේ නම්, ඉන් ඵලක් නැත. ආරම්භයේ පැමිණි අයගේ නම් බොහෝ විනෝදජනක විය. දැන් ඔවුන්ට එවන් නම් නොදෙයි. නම් දෙනු ලබන්නේ මෙහි ස්ථිරව හිඳ ඇති අයටයි. බොහෝ දෙනෙකුට නම් ලබා දුන් නමුත් ඉන්පසුව ඔවුන් පියාව දික්කසාද කර පිටව ගියා. දැන් නම් වෙනස් නොකරන්නේ මේ නිසයි. පියා පහදා දෙන්නේ මෙම දැනුම ක්‍රිස්තියානුවන්ගේ බුද්ධියේද සනිටුහන් වෙයි. පැමිණ, භාරතයේ යෝගාව ඉගැන්වූයේ අශාරීරික පියා පමණක් බව, ඔවුන්ට වැටහෙයි. ඔබගේ පාපයන් පිළිස්සී යන්නේ පරම පියාව සිහි කිරීමෙන් පමණයි. ඉන්පසුව අපි ආපසු නිවසට යයි. මේ ආගමට අයත්ව සිට ඉන්පසුව වෙනත් ආගම් වලට හැරුණු අය, පැමිණ මෙහි සිටියි. මනුෂ්‍යයන්ට, මනුෂ්‍යන්ට විමුක්තිය ලබා දිය නොහැකි බව ඔබට වැටහෙනවා. මේ දාදා ද මනුෂ්‍යයෙකි. ඔහු පවසන්නේද මට කිසිවෙකුට විමුක්තිය ලබා දිය නොහැක. ඒ බාබා අපට උගන්වන්නේ පරම පියාගේ සිහිපත් කිරීම තිබීම තුළින් පමණයි අපට විමුක්තිය ලබා ගැනීමට හැකි වන්නේ. පරම පියා පවසන්නේ දරුවනේ, අහෝ ජීවාත්මයනේ, මා සමග යෝගාවේ සිටින්න, එවිට ඔබගේ පාපයන් දුරු වෙයි. මුලදී ඔබ පිවිතුරු සහ ස්වර්ණමය යුගී විය ඉන්පසුව වෙනත් ලෝහ ඔබ තුළට මිශ්‍ර විය. ප්‍රථමයෙන් කැරට් 24ක්ව සිටි දේවතාවන් දැන් කලි යුගයට ලඟා වී ඇත. ඔබ සෑම කල්පයකදීම මෙම යෝගාව හැදෑරිය යුතුයි. ඔබගෙන් සමහරෙක්

සෑම දෙයක්ම දන්නා අතර වෙනත් අය ඊට අඩුවෙන් දන්නා බව ඔබට වැටහෙයි. සමහරු මෙහි උගන්වනනේ කුමක්ද කියා බලාගැනීමට පමණක් පැමිණෙයි. ටිකක් සිතන්න බොහෝ බ්‍රහ්ම කුමර කුමරියන් ඉන්නවා, එබැවින් අනිවාර්යෙන් ප්‍රජාපිතා බ්‍රහ්ම සිටිය යුතු අතර බොහෝ දෙනෙක් ඔහුගේ දරුවන් බවට පත් වී ඇත. එතැන අනිවාර්යෙන් යම් දෙයක් ඇති, එනිසා අපි ගොස් ඔවුන්ගෙන් ඒ ගැන විමසමු. 'ඔබට ප්‍රජාපිතා බ්‍රහ්මගෙන් ලැබෙන්නේ මොනවාද?' මෙය විමසිය යුතුයි නමුත් ඔවුන්ගෙන් කිසිවෙකුට මෙතරම් බුද්ධියක්වත් නැත! භාරතය වෙනුවෙන් විශේෂයෙන් පැවසෙන්නේ, 'ගල් බුද්ධි තිබුණු අය දිව්‍යමය බුද්ධි ඇති අය බවට පත් වූ අතර දිව්‍යමය බුද්ධි තිබුණු අය, ගල් බුද්ධි ඇති අය බවට පත් විය.' ස්වර්ණමය සහ රිදී යුගයන්හි ඔබට දිව්‍යමය බුද්ධි තිබුණු අතර ඔබ ස්වර්ණමය යුගී විය, ඉන්පසුව රිදී යුගයේ ඒවා කලා දෙකකින් අඩු විය. 'චන්ද්‍ර රජ පෙළපත' යන නම තිබෙන්නේ ඔවුන් අසමත් වූ නිසාය. මෙයත් පාසැලකි 33%ට අඩුවෙන් ලකුණු ලැබෙන අය අසමත් වනවා. රාමා, සීතා සහ ඔවුන්ගේ පෙළපත පරිසමාප්ත නැත, ඔවුන්ට සූර්ය පෙළපතේ අය විය නොහැක්කේ මේ නිසයි. විභාගය ඉතා උසස් නිසා සමහරු අසමත් වෙයි. පෙරකල, රජය විසින් වැදගත් ෂගකගී විභාගය පැවැත්විය. ඒ සඳහා සෑම කෙනෙකුටම ඉගෙන ගත නොහැක. බොහෝ දෙනෙකුගෙන් මතු වන්නේ අතලොස්සක් පමණයි. කෙනෙකුට සූර්ය වංශික අධිරාජයෙක් හෝ රාජිනියක් වීමට අවශ්‍ය නම්, ඒ සඳහා විශාල උත්සාහයක් අවශ්‍යයි. මම්මා සහ බාබාද ඉගෙනගන්නේ ශ්‍රීමත් වලට අනුවයි. ඔවුන් ඉගෙනගෙන අංක එක හිමිකරගනී. ඉන්පසුව මව සහ පියාව අනුගමනය කරන අය සිහසුන මත අසුන් ගනී. පළමුවන එඩ්වඩ් සහ දෙවන එඩ්වඩ් රජු සිටි ආකාරයටම සූ්‍ර්‍ය රජ පෙළපතේ, පෙළපත් 8ක් තිබේ ඔබට ක්‍රිස්තියානුවන් සමග විශාල සම්බන්ධකමක් තිබේ. ක්‍රිස්තියානු වංශය, භාරත රාජධානිය ගිල ගත්තේය. ඔවුන් භාරතයෙන් අසීමිත ධනය ගෙන ගියා. එබැවින් ස්වර්ණමය යුගයේ කෙතරම් අසීමිත ධනය තිබෙයිද කියා ටිකක් සිතා බලන්න. එය හා සසඳන විට මෙහි ඇති දේහි කිසි වටිනාකමක් නැත! එහි සියලුම ආකර පිරී තිබෙයි. සෑම අන්දමකම ආකර දැන් හිස් වී ඇත. චක්‍රය දැන් නැවතත් ඒ අන්දමින්ම සිදු වී සියලුම ආකර නැවතත් පිරෙයි. මිහිරිතම දරුවනේ, ඔබ දැන් රාවණ පරාජය කරමින් ඔබගේ රාජධානිය හිමි කරගන්නවා. පසුව චක්‍රයෙන් භාගයකට පසුව රාවණ පැමිණ ඔබට ඔබගේ රාජධානිය අහිමි වෙයි. භාරතයේ ඔය ජනතාව දැන් සිප්පි කටු මෙන් වී ඇත. මා ඔබව දියමන්ති හා සමාන බවට පත් කළ අතර රාවණ ඔබව සිප්පි කටු හා සමාන බවට පත් කළා. රාවණ පැමිණියේ කවදාද හෝ ඔවුන් ඔහුගේ පඹයෙක් පුළුස්සා දමන්නේ මන්ද කියා මිනිසුන්ට වැටහෙන්නේ නැත. ඔවුන් පවසන්නේ රාවණ, කාලයේ ආරම්භයේ සිටම සිටි බවයි. පියා විස්තර කරන්නේ රාවණ රාජධානිය ඇරඹෙන්නේ කල්ප භාගයකට පසුවයි. ඔවුන් දූෂිත වන බැවින් ඔවුන්ට තව දුරටත් තමන්ව දේවතාවන් ලෙස හැඳින්විය නොහැක. ඇත්ත වශයෙන්ම ඔබ අයත් වුනේ දේවතා ධර්මයටයි. ඔබ අත්විඳින සතුට තරම් සතුටක් වෙන කිසිවෙකුට අත්විඳිය නොහැක. දුප්පත්ම වන්නෙත් ඔබමයි. අනෙක් ආගම් වල ව්‍යාප්තිය සිදුවන්නේ පසුවයි. ක්‍රිස්තු තුමා පැමිණි විට ආරම්භයේ සිටියේ ඉතා සුළු පිරිසකි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් සිටින විට පමණයි ඔවුන්ට රාජධානියක් පාලනය කිරීමට හැකි වන්නේ. ඔබට ප්‍රථමයෙන්ම ඔබගේ රාජධානිය ලැබෙයි. මේ සියලු දේ දැනුමේ කාරණයාය. පරම පියා පවසන්නේ අහෝ ජීවාත්මයනේ, ඔබගේ පරමාත්ම පියා වන මා සිහි කරන්න. ඔබ කල්ප භාගයක් ශරීර අවධානයෙන් සිටියා. දැන් ජීවාත්ම අවධානයට පත් වන්න. චක්‍රයෙන් භාගයක්ම ඔබ මත මළකඩ බැඳී ඇති නිසා ඔබට මෙය නැවත නැවතත් අමතක වෙයි. මෙකල ඔබ බ්‍රහ්මණයන්ය, මුදුන් ගැටයයි. උසස්ම වන්නේ ඔබයි. සන්‍යාසීන් බ්‍රහ්ම තත්ත්වය සමග යෝගාවේ සිටින නමුත් එය තුළින් ඔවුන්ගේ පාපයන් දුරු වන්නේ නැත. සෑම කෙනෙක්ම අනිවාර්යෙන් සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව හරහා යා යුතුයි. කිසිවෙකුට ආපසු නිවසට යා නොහැක. සියලු දෙනාම තමෝප්‍රධාන් වූ විට පියා පැමිණ සියලු දෙනාව සතෝප්‍රධාන් කරවයි, එනම්, සෑම කෙනෙකුගේම ආලෝකය දැල්වෙයි. සෑම ජීවාත්මයකටම තමන්ගේම චරිත කොටසක් ලැබී ඇත. ඔබ ප්‍රධාන නළු නිළියන්ය. ඔබ රාජධානිය හිමි කරගෙන ඉන්පසුව එය අහිමි කරගන්නා බැවින්, භාරතයේ ජනතාව වන ඔබ උසස්ම අයයි. වෙනත් කිසිවෙකුට මේ ආකාරයට රාජධානියක් හිමි වන්නේ නැත. ඔවුන් රාජධානි අත්කර ගන්නේ භෞතික බලයෙන්ය. ලෝකයේ අධිපතියන්ව සිටි අය නැවතත් එය බවට පත් වන බව, බාබා විස්තර කර ඇත. පියා හැර වෙනත් කිසිවෙකුට ඔබට සත්‍ය රාජයෝගාව ඉගැන්විය නොහැක. මිනිසුන් උගන්වන යෝගාව වැරදි යෝගාවයි. කිසිම කෙනෙකුට පෙරලා නිවහනට යා නොහැක. එය දැන් අවසානයයි. සියලු දෙනාම දුකින් මිදෙන අතර ඉන්පසුව ඔවුන් අංක පිළිවෙලට පහළට පැමිණෙයි. පළමුව සතුට අත්විඳ ඉන්පසුව දුක අත්විඳියි. මේ සියලු කාරණා වටහා ගත යුතුයි. මෙවන් කියමනකි ඔබගේ දෑත් ක්‍රියා සිදුකරන අතර ඔබගේ හදවතින් පියාව සිහි කරන්න. නොකඩවා ඔබගේ කාර්යයන් සිදුකරමින් ඔබගේ බුද්ධිය යෝගාවෙන් පියාට සම්බන්ධ කරන්න. ඔය ජීවාත්ම ඒකායන පෙම්බරයාගේ පෙම්වතුන්ය.

එම පෙම්බරයා දැන් ඇවිත්. ඔහු ඔය සියලුම මනාලියන්ව ලස්සන කර ඔහුත් සමග ආපසු නිවසට ගෙන යයි. ඔහු කල්ප භාගයක අසීමිත මනාලියන්ගේ අසීමිත මනාලයාය. ඔහු පවසන්නේ මා සියලු දෙනාව ආපසු නිවසට ගෙන යනවා. එවිට ඔබ දරන උත්සාහයට අනුව අංක පිළිවෙලට ඔබගේ තත්ත්වය ඔබ හිමි කරගනීවි. ඔබට තම නිවසේ වාසය කරමින් ඔබගේ දරුවන් බලා ගත හැක. අහෝ ජීවාත්මයනි, ඔබගේ හදවත් පියා දෙසට යොමු විය යුතුයි. නොකඩවා මෙම සිහිකිරීම පුහුණු වන්න. පියාව සිහි කිරීමෙන් ඔබ දෙව්ලොව වැසියන් වීමට යන බව ඔය දරුවන්ට දැන් වැටහෙයි. ශිෂ්‍යයන්ට බොහෝ සතුට තිබිය යුතුයි. මෙය ඉතා පහසුයි. නාටකයට අනුව ඔබ සියලු දෙනාටම මාර්ගය පෙන්වනවා. කිසිවෙකු සමග තර්ක කිරීමට අවශ්‍ය නැත. මේ සියලුම දැනුම දැන් ඔබගේ බුද්ධිය තුළ තිබේ. මනුෂ්‍යයන්ට රෝගයක් තිබී සුව වූ විට මිනිසුන් ඔවුන්ට සුබ පතයි. මෙහි මුළු ලෝකයම රෝගීය. කෙටි කාලයකදී ජයග්‍රහණයේ ඝෝෂාව ඇසෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැතිවී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියා ගෙන් අධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සැබෑ පෙම්වතුන් වන්න. ඔබගේ දෑත් වලින් නොකඩවා වැඩ කරන අතර ඔබගේ බුද්ධියෙන් පෙම්බරයා සිහි කිරීම පුහුණු වන්න. පියාගේ සිහි කිරීම තුළින් ඔබ දෙව්ලොව වැසියන් වන බවට සතුට පවත්වාගන්න.
2. සූර්ය වංශික රජ පෙළපත් සිහසුන මත අසුන් ගැනීම සඳහා සම්පූර්ණයෙන් මව සහ පියාව අනුගමනය කරන්න. පියා මෙන්ම දැනුමින් පිරිපුන් වී සියලු දෙනාට මාර්ගය පෙන්වන්න.

**වරදානය:** ඔබ බාප්දාදාගේ උපකරණ වී ඔටුන්නක් සහ තිලකයක් පැළඳගෙන හෘද සිංහාසනයේ අසුන් ගනිත්වා.

යමෙකු සිංහාසනයක අසුන් ගත් විට, තිලකය සහ ඔටුන්න එහි සලකුණු වේ. ඒ හා සමානව, හෘද සිංහාසනයේ අසුන් ගත් අයගේ නළලෙහි දෘශ්‍යමාන ලෙස දිලිසෙන ජීවාත්ම අවධාන අවධියේ තිලකයක් සෑම විටම ඇත; එය දුර සිට දැකිය හැකිය. සියලු ජීවාත්ම සඳහා කරුණාවන්ත සුබ පැතුම් ඔවුන්ගේ ඇස් වල සහ ඔවුන්ගේ මුහුණු වල දක්නට ලැබේ. ඔවුන්ගේ සෑම සිතුවිල්ලක්ම, වචනයක්ම සහ ක්‍රියාවක්ම පියාගේ සිතුවිල්ලට සමාන වේ.

**පාඨය:** ඔබේ සංස්කාර පහසු (සහජ) කර ගැනීම සහ ස්මරණය පහසු කිරීම සඳහා, පහසුකමේ (සහජ බවේ) ගුණය උකහා ගන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ජයග්‍රහණයේ අත්තිවාරම ශ්‍රද්ධා විශ්වාසයයි. අත්තිවාරම ශක්තිමත් නම්, ගොඩනැගිල්ල සෙලවිය නොහැක; ඔබ බාධක වලින් නිදහස්ව සිටී. කෙසේ වෙතත්, එය පරම පියා කෙරෙහි පමණක් ඇති ශ්‍රද්ධා විශ්වාසය නොවේ, ඔබ කෙරෙහි සහ නාට්‍යය කෙරෙහිද විශ්වාසය තැබිය යුතුය. වා නාටකය! වා! ඔබට නාටකය කෙරෙහි විශ්වාසය ඇති තැන, යහපත් නොවන ඕනෑම දෙයක් යහපත් වනු ඇත.